# අහෝ දුප්පතාගේ හිතවතාණෙනි!

අබුද්දස්ස කාලයේ පවතින සමාජය යහපත් එකක් නොවේ. මේ කාලයේ රැස් කරන්නේ අයහපත් දේය. පාප කර්මයන්ය. ඒ පාපකාරී යුගයේ ප්‍රියමනාප දෙය අප්‍රිය මනාප තත්වයට පත්වෙයි. ඒ කාලයේ මිනිසා පුදුම කරවන අරුම පුදුම දේ සිදුවෙයි. ඒ කාලයට ලබු ද කිත්ත විය හැක.

හිඟන්නාගේ පාත්තරයට හෙනහුරා කඩා වැටෙන ඉහත කී යුගයට අප කෙමෙන් කෙමෙන් ලංව සිටින්නේ යැයි කීවොත් මා නිවැරදිය. මන්ද ලෝක බැංකු සභාපති ධූරයට මූලධර්මවාදී යුදවාදී ඇමෙරිකන් නායකයකු පත්වීමට යාමයි. ඔහු පෝල් වුල්ෆෙවිට්ස්ය.(Paul Wolfowitz)



පෝල් වුල්ෆෙවිට්

පෝල් ලෝකු බැංකු සභාපති ධූරයට පත් වන්නට යන්නේ ඔහු දුප්පත්කමට එරෙහිව ආමෙරිකන් සමාජයේ බල අරගලයක් නොකළ නිසාවෙනි. ඔහු කළ එකම දෙය නම් මූලධර්මවාදය වෙනුවෙන් ඇමෙරිකන් සෙබළුන්ට මුස්ලිම් ලෝකයට ඇතුළු වීමට ඉඩ සලසා දීම පමණි. නියෝජ්‍ය ආරක්ෂක ලේකම්වරයා ලෙස කටයුතු කරන කාලයේ ඔහු ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් බෝම්බ මූනිස්සම් නිපදවන යුධ කාර්මාන්තකරුවන් තව තවත් ශක්තිමත් කළේය. ඒ තුළින් ඔවුන්ගේ දුප්පත්කම තුරන් විය. මූලධර්මවාදයේ නාමයෙන් සීමිත සම්පත් සීමිත පිරිසක් අතරේ හුවමාරු වීමේ වැඩකට හරියාකාරව දත ගැසීය

සුදුස්සාට සුදුසු තැන දීමේ ජෝර්ජ් බුෂ් ජනාධිපතිවරයාගේ නියමයෙන් ඔහු ලෝක බැංකු සභාපතිවරයා කිරීමේ කටයුත්තට ඇමෙරිකාව අත ගසා ඇත. සාම්ප්‍රදායිකව ලෝක බැංකු සභාපති ධූරය ඇමෙරිකාවට ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සභාපති ධූරය යුරෝපයට ද යන ලෙස ලෝක ධන ආධිපත්‍ය ඇමෙරිකාව හා යුරෝපය අතර බෙදා හදාගෙන ඇත.

එහෙත් ලෝක සම්ප්‍රදායිත්වය ද අද වෙනස් වෙමින් තිබේ. එදා ලෝක ආධිපත්‍ය මෙහෙය වූ එංගලන්තය අභිබවා ඇමෙරිකාව ඉදිරියට පැමිණ ඇත. අද ඇමෙරිකාව ලෝකයෙන් ණයට බඩු හිඟාකන රටක් බවට පත්ව ඇත. පසුගිය වසරේ ඇමෙරිකානු වෙළඳ හිඟය ඩොලර් බිලියන 540කි. එහි තේරුම දෛනිකව ඇමෙරිකාව තමන් සතු ඩොලර් බිලියන 26 මූල්‍ය වත්කම් විදේශයන්ට විකිණීමයි. (විශේෂයෙන්ම චීනයට) මෙම තත්වය යටතේ වාර්ෂිකව ඩොලර් 1ක ආදායමක් ලබන කොටි 12ක ජනතාවගෙ ස්වභාවික සම්පත් කුණු කොල්ලයට ඇමෙරිකාවට විකිණීම මෙම පත්වීම හරහා සිදුවිය හැක.

THE WORLD BANK

ලෝක නායකයන් හා ඇන්ග්ලෝ ඇමෙරිකන් නායකයන් වන ජෝන් හාවඩ් හා ටෝනි බ්ලෙයාර් තේරුම් ගත යුතු එකක් ඇත. දුප්පතුන් තවත් දුප්පත් කිරීම වෙනුවට පෝසත් රටවල් විසින් දුප්පත් රටවලින් සූරා කන එම දුප්පත් රටවල් අතර හුවමාරු වීමට අරින්නේ නම්, දුප්පත් රටවල මිනිසුන් අතර පෝසත් රටවල් කෙරෙහි ඇතිවන ක්‍රෝධය, වෛරය හා පළිගැනීම ඇතිවන්නේ නැත. එමගින් ත්‍රස්තවාදයක් ද ඇතිවන්නේ නැත. ලෝකය තව තවත් සාමය පිරුණු, සමගිය පිරුණු තෝතැන්නක් බවට පත්වනු ඇත.

එසේ හෙයින් ලෝක බැංකු සභාපති විය යුත්තේ මනුෂ්‍යත්වයෙන් පිරුණු, අහිංසක මිනිසුන්ගේ දුප්පත් බව ඇතිවන සූරාකෑම මර්ධනය කිරීම කළ හැකි නායකයකුට හා දුප්පත් පෝසත් රටවල් අතර සන්ධානයක් ගොඩනැගිය හැකි මිනිසෙකුට පමණි. නොඑසේම යුධ මූලධර්මාවාදයෙන් මොළය කුණු කර ගත්, දුප්පත්කමට විසඳුම ඔවුන්ගේ ස්වභාවික සම්පත් ධනවතුන්ට (ඇමෙරිකාවට) විකිණීම යයි සිතන මිනිසෙකු නොවේ.

**සාලිය ගලප්පත්ති**


